ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් — තනතුරු සංඛ්‍යාව : 01

සේවා ගණය : **MM 1-1**

## තනතුරෙහි ස්වභාවය

- සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සමඟ උපදේශනයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම, න්‍යාය පත්‍ර සකස් කිරීම, මණ්ඩල ලේඛන නියමිත කාලය තුළ බෙදා හැරීම සහතික කිරීම, රැස්වීම්වලට සහභාගී වී නිවැරදිව වාර්තා සහ තීරණ සටහන් කිරීම ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලයට වෘත්තීයමය ලේකම් හා පාලන (Governance) සහාය සැපයීම.
- රජයේ ප්‍රතිපත්ති, භාණ්ඩාගාර නියෝග විසින් නිකුත් කර ඇති ආයතනික පාලන මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන බව සහතික වීම.
- සියලුම ව්‍යවස්ථාපිත ලේඛන, මණ්ඩල රැස්වීම් වාර්තා, තීරණ, රහස්‍ය ලේඛන සහ අනෙකුත් ආයතනික වාර්තා නිවැරදිව පවත්වාගෙන යාම, සුරක්ෂිතව භාරයේ තබා ගැනීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සහ බලයලත් පරීක්ෂණ හා විගණනය සඳහා අවශ්‍ය විට ලබාදීමට හැකි වන පරිදි සංරක්ෂණය කිරීම.
- මණ්ඩල තීරණ ලේඛනයක් පවත්වාගෙන යාම, එකඟ වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ කළමනාකරණය සමඟ පසු විපරම් කිරීම, ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම සහ ආයතනික පාලන කටයුතු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණය, විෂය භාර අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන් අතර කාර්යක්ෂම සන්නිවේදනය හා සම්බන්ධීකරණය පහසු කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන වෙනත් රාජකාරී ලිපි සැකසීමේ කාර්යය.

## සුදුසුකම් (පහත 1 හෝ 2)

1. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දී තිබීම

   **සහ**

   ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු ලෙස දිවුරුම් දීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. රාජ්‍ය පරිපාලන / ව්‍යාපාර කළමණාකරණය / නීතිය / හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

## වයස් සීමාව

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

---

## වැටුප් පරිමාණය

**MM 1-1 - 2025 - රු. ( 91,690 - 10 x 2,480 - 15 x 3,450 - 168,240)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)